# විප්ලවවාදියකුගේ සැබෑ කතාව

**සැබෑ මිනිසකු කියන සත්‍ය කතාව අසා ලියන්නේ**
**ජගත් ජේ එදිරිසිංහ**

**10**

මේ වන විට මා ගෙදරට වී සිටි කාලය සතියක් පමන වී තිබිනි. මේ කාලය පුරා කලකින් නොදුටු මිතුරන් හිතවතුන් හා අසල්වාසීන් හා අදහස් හුවමාරුවකට මට බොහෝ ඉඩ කඩ ලැබිනි. මා හා එකට පාසල් ගිය මිතුරන් කීප දෙනෙක්ම ඒ අතර විය. ඔවුන් සියළු දෙනාම පාහේ ඒ වන විට විශ්වවිද්‍යාල අධ්‍යාපනය ආරම්භ කොට තිබිනි. පැමිනි සිටි දෙනාගේ අදහස් සම්පිණ්ඩනය කොට ගත හොත් එය වදන් දෙක තුනකට සීමා කල හැකිව තිබිනි. එනම්

''දැං ඉතිං ඔය මදිද?'' ලෙසයි.

එකම මාතෘකාව යටතේ කථා කරමින් පිලිතුරු සපයා මම හෙම්බත් වී සිටියෙමි.

තාත්තා පමණක් ගැඹුරු නිහතාවක වෙලී සිටිනු මම නිරීක්ෂණය කළෙමි. ඔහුට කතා කරන්නට ඇවැසිව තිබුණ නමුත් ඒ සඳහා සුදුසු අවස්ථාව එනතෙක් බලා සිටින බව මම දැන සිටියෙමි.

සතියක් අවසන් වන විට ක්‍රමයෙන් පැමිණීමද අඩු වී මම ක්‍රමයෙන් හුදෙකලා වන්නට පීව්. මේ සතිය විමද මට මහත් බරක් වී තිබිනි. අමුත්තන් අඩු වීගෙන ගොස් උදය කාලයේ තාත්තා මල්ලී සහ නංගීද අධ්‍යාපන කටයුතු සඳහා ගෙදරින් පිටවූ පසු ගෙදර සිටියේ මවත් ගෙදර වැඩ වලට උදව්වට පැමිණි සිටි අපගේ ඥාති නැන්දනියන් පමනයි. දවස පුරාම අවට පරිසරයේ පවතින නිහැඬියාව මට ඉහිලුම් නොදන තරම් විය. ඉදහිට මහපාරේ ගමන් ගන්නා බසයක හඬ හැරුන කොට දවස පුරාම අසන්නට ලැබෙන්නේ හුළං හමන ශබ්දයත් කුරුල්ලෙකුගේ ශබ්දයක් පමනි. වර්තමානයේ යම් තරමක දියුණුවක් ලබා තිබුනද මීට වසර 40 කට පමණ පෙර අගලවත්ත ප්‍රදේශයේ හුදෙකලා ගම්මානයක ඇති නිහැඬියාව ගැන දල තක්සේරුවක් ඔබට කල හැකි යැයි මම සිතෙන්නෙමි.

මගේ පීඩාකාරී සිත ඉවෙන් මෙන් අදුනා ගත්තාක් මෙන් ගෙදර පැමිණ දින අටකට පසු රාත්‍රියේ කෑමෙන් පසු තාත්තා මා ඇමතීය. ඒ නිහඬ රාත්‍රියේ තාත්තාත් මාත් රාත්‍රි දෙගොඩහරියක් වනතෙක් කතා කළෙමු.



**අවංකවම කියනවා නම් මේ සමාජ ක්‍රමය අපි පතන සමාජ ක්‍රමයක් දක්වා පරිවර්තනය කරන හීනය දකින එක මම අතහැරල බොහොම කල්.**

එදා රාත්‍රියේ තාත්තා කී බොහෝ දෑ පසු අනාගතයේ පැහැදිලි සත්‍යයක් වන බවක් එදින මම නොදැන සිටියෙමි. තාත්තා කියූ අනාගත වාක්‍ය කෙතරම් සැබෑ වූවාද යන්න සිහිපත් කරන අද දිනයේ පවා ඔහු තුළ තිබූ දුර දක්නා නුවණ පිළිබඳ මට ඇති වන්නේ මහත් විමතියකි.

භක්තියකි.

"දේශපාලනය කරන්න යනව කියන එක අතුරෙ යනව වගෙ වැඩක්" තාත්තා කතාව ඇරඹුවේ එසේය. මම අසා සිටියෙමි. "විශේෂයෙන් වාමාංශික දේශපාලනය.. එයිනුත් දැන් මේ උඹ කරන දේශපාලනය"

තාත්තා කතාව නවත්වා ම දෙස මොහොතක් බලා සිටියේය. ඔහුගේ දෑසේ රැඳී ඇති තේරුම් ගත නොහැකි බැල්ම පෙට්‍රොමැක්ස් ලාම්පුවේ එළියෙන් මට හොඳින් පෙනෙයි.

"...මට උඹව තේරුම් ගන්න පුළුවන්. උඹ වටේට ඉන්න මිනිස්සු කියන දේවල් මට කියන්න අවශ්‍ය නැහැ. කලේ මොකක්ද උනේ මොකක්ද, වෙන්නේ මොකක්ද කියලා උඹට යම් තේරුමක් ඇතිනේ. ඉතිං ඒ අනුව තවත් ඉදිරියට පිළිබඳ තීරණය ගන්න එකයි දැං කරන්න ඕනේ." ඔහු කීවේය.

"තාත්තා මොකක්ද කියන්නේ..?" මම ඇසුවෙමි.

තාත්තා සිනාසුණේය. එය උපහාසාත්මක සිනාවක්දැයි මට අදත් නොවැටහෙයි. ඒත් ඔහුගේ දෑසේ රැඳී තිබුණ අනුකම්පා සහගත බැල්ම මම හොඳින් වටහා ගත්තෙමි. සියල්ල අතහැර ගිහිගෙයින් නික්ම ගියා සේ සිය මුලු ජීවිතයම දේශපාලනයට කැප කළ පුතෙකු සිටින පියකුගේ මුහුණෝ නිබඳව දැකිය හැකි වේදනාවේ සළණු මම ඒ මොහොතේ දුටුවෙමි.

ක්ෂණයකින් මට වැටහුනේ මගේ ප්‍රශ්නයෙහි ඇති නොමේරූ බවය.

"..අපුරු විචලවාදියා" තාත්තා සෙමින් කියනු මට හොඳින් ඇසුනි. මට දැනුනේ මහත් අපහසුවකි. ඒ සැනින්ම මගේ මොළය වෙනුවට හදවත ක්‍රියා කරමින් මා වාඩි වී සිටි තැනින් නැගිටවිනි.

"ඉඳගනින්" ඒ තාත්තාගේ විධානයි. මම යළිත් ඉඳගතිමි.

"මට මේ ප්‍රශ්නයට අවංක උත්තරයක් දෙනවා. තමුන්ට මේ දේශපාලන කටයුතු වලට මම නිදහස දුන්නේ ඇයි කියලා තේරෙන විදිහට මට පැහැදිලි කරන්නව බලන්න."

මට අද වැටහෙන විදිහට මා එදා දුන්නේ අවංක උත්තරයක් වුවද එය කටපාඩම් කළ ගිරා පිළිතුරකි.

"මේ ක්‍රමය වෙනස් කරන්න අංශු මාත්‍රයකින් හරි සහනයක් දෙන්න. තාත්තලාට කරන්න බැරිවුණ ඒ සමාජ වෙහෙවර කරගන්න තාත්තාගෙන් ඉටුවිය යුතු වගකීමේ කොටසකට දායක වෙන්නයි. ඒ නිදහස දුන්නේ" ඒ මගේ පිළිතුරයි.

මගේ පිළිතුරත් තාත්තා බලාපොරොත්තුවන්නට ඇත . ඔහු උපහාසයෙන් සිනාසුණේය. තාත්තා ලග තිබූ වතුර වීදුරුවෙන් අඩක්ම හිස්කොට මා දෙස බැලුවේය. ඉන්පසු ඔහු එක දිගට විනාඩි විස්සක් පමණ කළ දේශණය (සත්තකින්ම එය පැහැදිලි කිරීමකි) මම අසා සිටියෙමි.

"මම මේ කියන දේ උඹ හරියට තේරුම් ගන්නකොට තව අවුරුදු 30-40 ක් යයි. එතකොටත් උඹල අද මේ කරන දේ තවත් පරම්පරාවක් කරනව දකින්න පුළුවන් වෙයි. අවංකවම කියනවා නම් මේ සමාජ ක්‍රමය අපි පතන සමාජ ක්‍රමයක් දක්වා පරිවර්තනය කරන හීනය දකින එක මම අතහැරල බොහොම කල්. ඒක මේ රටේ වෙන්නේ නැහැ. ඒක නුවුනාය කියලාත් ඒ සඳහා දරන උත්සාහය අත් හරින්න හොඳ නැත්තේ දරන උත්සාහය නමැති ක්‍රියාවලිය ඔස්සේ යහපත් මිනිස්සු කොට්ඨාසයක් මේ සමාජයට උත්පාදවන නිසයි. ඒ මිනිස්සු නිසා මේ සමාජය අගාධය කරා යන ගමන පමා වෙනවා. මේ ගන්නා උත්සාහයේ ප්‍රතිඵලයක් හැටියට උඹලට යම් අයිතීන් කොටසක් දිනාගන්න හැකිවේවි. ඒකත් ලේසි වෙන්නේ නැහැ. මේ යන විදිහට වැඩි ඈතකට නොගිහින් අපි කළදේම උඹලටත් ඊටත් වසා දරුනු විදිහට කරන්න වේවි. මේ කරුනු ගොනු වෙමින් යන්නේ එතනට. එතනින් පස්සේ උඹල අද කරන මේ වැඩේ තව කොටසක් පටන් ගනී. ඔහොම මේක ඉදිරියට යයි. මම උඹට ඉඩ දීල ඉන්නෙ සමාජ විප්ලයට වඩා හොඳ සාධාරණව හිතන පතන හැමෝම නොකරන හොඳ දෙයක් කරන මිනිහෙක් වෙනවා දකින්න.. උඹේ වයසට දේශපාලන පූර්ණ කාලිකයෙක් වෙනව කියන්නේ එත්තරා විදිහක විශේෂිත දෙයක්... පක්ෂයේ ඉතිහාසෙම මෙහෙම මිනිස්සු හිටියේ බොහොම ටික දෙනයි. ඒ මොනව උනත් මට උඹට දෙයක් කියන්න තියෙනවා. ඒක ඉල්ලීමක් අවවාදයක් හෝ කැමති විදිහක හිතාගනින්. දැං උඹ මේ යන ගමනේ එක හැරවුම් ලක්ෂයකට එන්න ඕනෙ. උඹ මේ දේශපාලනය කරන ගමන් මොනව හරි ශිල්පයක් ඉගෙන ගන්න ඕනෙ. ඒක උඹේ වැඩට බාධාවක් නොවන හැටියට කරගන්න පුළුවන්නේ. එක මොන ක්ෂේත්‍රයක් උනත් කමක් නැහැ. මොනව හරි ශිල්පියක් ඉගෙන ගන්න වැඩ පිළිවෙලක් හඳුනා ගනින්. ඒක නොකළොත් ඒකේ අපහසුතාව උඹට ජීවිතේ කවදාම හරි දැනෙයි."

ගල්, බොරළු ඉවත් කොට ගත්කළ තාත්තේ එදා රාත්‍රී දේශනාවේ අර්ථය එයයි. එය සැබෑ ලෙසට විශ්මිත දේශනාවකි. එදා කියූ පරිදිම ඊට වසර 6 කට පමණ පසු අපි සැම දරුණු යුද්ද හා පැටලී විනාශ වුනෙමු. ඊට පසු නැවතත් මුල සිටම පටන් ගෙන ගමන ආරම්භකොට මදක් විශ්‍රාම ගත්තෙමු. දැන් තාත්තා කතා කොට වසර 40 පසුත් අප කළ දේම තවත් පරම්පරාවක් කරමින් සිටියි.

තාත්තාගේ අදහස පරිදි ශිල්පයක් ඉගෙන ගැනීමට මට ඉඩ නොලැබිනි. එහි විපාක නොරටට පැමිණ රැකියාවක් සොයා ගැනිමේදි මම මනා ලෙස අත් වින්දෙමි. තාත්තා වැනි මිනිසෙකුගේ සැබෑ ජිවනාබෝධය කෙතරම්ද? ඔවුන්ට තුන්කල් දැකිය හැකි නුවණක් පහළවන්නේ කෙසේද?

දෙවන සතිය අවසානයේ වැසිබර උදෑසනක ගෙදර පිට කාමරයේ දොරින් එබුණෝ සුපුරුදු ලෙන්ගතු සිනාවක් මුවේ රඳවාගත් අමරේ සහෝදරයා ය.

"මොකද මේ කරන්නෙ?" ඔහු අසයි.

**මතු සම්බන්ධයි**

සුභාවිත ගීතයේ අන්තර්ජාල නවාතැන - තිසර ගුවන්විදුලිය www.thisara.com